# NATURE OF POLITICAL SCIENCE, STUDY OF POLITICS AND APPROACHES (Part II)

# දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය

මෙය පැති කීපයකින් දැකිය හැකි ය.

I. දේශපාලනය කිරීම. (doing politics)
II. දේශපාලනය හැදෑරීම. (studying politics)

## I. දේශපාලනය කිරීම.

මින් අදහස් වන්නේ

- ✓ ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීම.
- ✓ ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීම.
- ✓ මැතිවරණවලට සහභාගි වීම.
- ✓ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වයට සම්බන්ධ වීම.
- ✓ සටන් හා විරෝධතා ව්‍යාපාර ආදියට සහභාගි වීම.

වශයෙන් පුද්ගලයන් යෙදෙන ක්‍රියාකාරකම් ය.

ClassWork.LK

දේශපාලනය කරන පුරවැසියන්ටද වෘත්තීය දේශපාලනඥයන්ට ද දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය දැනුමක් හෝ විශේෂඥතාවක් හෝ අවශ්‍ය වන්නේ නැත. අවශ්‍ය වන්නේ ''දේශපාලනය'' යන සමාජ ක්‍රියාකාරකමෙහි යෙදීමට ඇති කැමැත්ත,කැපවීම සහ අධිෂ්ඨානයයි

ClassWork.LK

## II. දේශපාලනය හැදෑරීම

මෙය දේශපාලනය කිරීමට වඩා වෙනස් කාර්යයකි. "දේශපාලනය හදාරන්නා" (student of politics) දේශපාලනය ප්‍රායෝගික ව කරන්නකු ලෙස හඳුන්වන්නේ නැත. එදිනෙදා ව්‍යවහාරයේ දී සිදු කරන මෙම වෙනස දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති සම්බන්ධය තේරුම් ගැනීමට ඉවහල් වෙයි.

- ශාස්ත්‍රීය ලෙස දේශපාලනය අධ්‍යයනය කිරීම සහ ප්‍රායෝගිකව දේශපාලනයෙහි යෙදීම එකිනෙකට වෙනස් භාවිත දෙකකි.
- දේශපාලන විද්‍යාවේ කාර්යය දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීම ය.
- කෙනෙකු දේශපාලනය ප්‍රායෝගික වශයෙන් නොකළත් දේශපාලනය හැදෑරිය හැකි ය.

ClassWork.LK

ඒ අනුව

- දේශපාලන පක්ෂවල හා සංවිධානවල ක්‍රියාකාරිත්වය ආණ්ඩු බලය ලබාගැනීමට දේශපාලන පක්ෂ සහ බලවේග අතර ඇතිවන තරගය
- මැතිවරණ ව්‍යාපාර
- වෘත්තීය දේශපාලනඥයන්ගේ චර්යාව
- ඡන්ද දායකයන්ගේ චර්යාව
- දේශපාලන ගැටුම්, විරෝධතා හා කැරලි
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති
- ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි
- අන්තර්ජාතික සම්බන්ධතා සහ ගැටුම්
- යුද්ධය හා සාමය

ආදී පුළුල් පරාසයක විහිදී ඇති දේශපාලනික තේමා රාශියක් ම දේශපාලන විද්‍යා අධ්‍යයනයේ ප්‍රස්තුත, නැතහොත් විෂය වස්තූන්, වී ඇත.

Class Work.LK

ClassWork.LK